# 02 පෙරුම් දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති

අප මහා බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරදුන්ගෙන් පටන්ගෙන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දක්වා බුදුවරු විසිහතර නමකගෙන් විවරණ ලැබූහ. එය සුවිසි විවරණය නම් වේ. සාර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් තිස්සේ දන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා යන දස පාරමිතා පිරූ අප මහා බෝසතාණන් වහන්සේ අවසන් වතාවට වෙස්සන්තර නමින් රජ කෙනෙකු ව උපන්නේ ය. බෝසත් ගුණ පුරුද්ද නිසා රජ සැප ගැන කලකිරුණු එතුමා රජකම අතහැර තවුස් දිවියෙන් පැවිදි විය. එතුමා වනගත වෙද්දී තමාට අයත් සියලු දේ දන් දුන්නේ ය. මේ ආකාරයෙන් දන පාරමිතාව පුරමින් ගතකළ වෙසතුරු රජතුමා මියපරලොව ගොස් තුසිත දෙව්ලොව සන්තුසිත නම් දිව්‍යරාජයා වී උපන්නේ ය.

බුදු කෙනෙකුන් පහළවන කාලය ලංවන විට ලෝකයේ බුද්ධ කෝළාහලයක් ඇති වෙයි. දෙවියන්, බඹුන්, මිනිසුන් යන මේ හැම දෙනා අතර ම කවුද, කවුද, බුදුවන්නේ? යන සැකය ඇති වෙයි. සියලු දෙනා ම ඒ ගැන සොයන්නට පටන් ගනිති. බුද්ධ කෝලාහලය යනු එය යි. අන්තිමේ දී බුදුවන බෝසතාණන් වහන්සේ සන්තුසිත දිව්‍යරාජයා බව දෙවිවරුන්ට දැනගැනීමට ලැබිණ. සියලු දෙවිවරු එතුමා වටා රැස්වී එතුමාට බුදුවන්නැ'යි මෙසේ ආරාධනා කළහ.

> "කාලො'යං තෙ මහාවීර
> උප්පජ්ජ මාතු කුච්ජියං
> සදෙවකං තාරයන්තො
> බුජ්ඣස්සු අමතං පදං"

"වීරයන් වහන්ස, ඔබ වහන්සේට බුදුවන්නට දැන් කාලය පැමිණ තිබේ. මිනිස් ලොව මව් කුස ඉපිද නිවන් අවබෝධ කොට දෙව් මිනිසුන් සසරින් එතෙර කරනු මැනවි."



දෙවිවරුන්ගේ ආරාධනාව පිළිගත් සන්තුසිත නම් බෝසත් දිව්‍ය රාජයා මිනිස් ලොව ඉපදීමට තීරණය කළා. බුදු වන ආත්ම භාවයේ බෝසත්වරුන් මිනිස් ලොව උපදින්නට පෙර කරුණු පහක් ගැන සොයා බලනවා. අපේ බෝසතාණන් වහන්සේ ද ඒ කරුණු පහ ගැන සෙවූහ. **කාලය, ද්වීපය, දේශය, කුලය, මව** යනු ඒවා යි. පස්මහ බැලුම් යනු මේවා යි. පස්මහ බැලුම් බැලූ බෝසත් දෙව්රජතුමා මිනිස් ලොව උපදින කාලය, ස්ථානය හා මවුකුසත් තීරණය කර ගත්තේ ය.

### ක්‍රියාකාරකම 2.1

පහත සඳහන් වැකි නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. බෝසත් දිව්‍ය රාජයාගේ නම සන්තුසිත ය. (    )
2. මෛත්‍රිය දස පාරමිතාවලට අයත් නොවේ. (    )
3. බුදු කෙනෙකු  පහළවන කාලය ලංවන විට ලෝකයේ බුද්ධ කෝළාහලයක් ඇති වේ. (    )
4. වෙස්සන්තර රජුගෙන් දරුවන් ඉල්ලා පැමිණියේ ජූජක බමුණා ය. (    )
5. ක්‍රිෂ්ණාජිනා ජාලියගේ නැගණිය යි. (    )
6. බෝසතාණන් වහන්සේ බුදු බව පතා බුදුවරුන් විසිහතර නමකගෙන් විවරණ ලැබූහ. (    )

7. වෙස්සන්තර රජු වනගත වෙද්දී මන්ද්‍රී දේවිය මාළිගයේ නතර වූවා ය. (    )
8. වෙස්සන්තර ආත්මභාවයේදී බෝසත් තුමා පුරන ලද්දේ දන පාරමිතාව යි. (    )
9. අප මහා බෝසතාණන් විවරණ ලැබීම ආරම්භ කළේ කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේදී ය. (    )
10. බුදුවීම පිණිස දෙවිවරුන් කළ ආරාධනාව බෝසතාණෝ එකවර ම පිළිගත්හ. (    )

## පැවරුම

බෝසතාණන් වහන්සේ බුදුබව පතා විවරණ ලැබූ සූවිසි බුදුවරයන් වහන්සේලා සහ ඒ ඒ ආත්මභාවවල බෝසත් නාමයන් සහ ඒ සඳහා කරන ලද පුණ්‍ය කර්මයන් සොයා වගුවක් සකස් කරන්න.

| විවරණ දුන් බුදුරජාණන් වහන්සේ | බෝසතුන්ගේ නාමය | කරන ලද පුණ්‍ය කර්මය |
|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5. | | |

### පුහුණුවට

**කාලං දීපඤ්ච දෙසඤ්ච**
**කුලං මාතරමෙව ච**
**එතෙ පඤ්ච විලොකෙත්වා**
**උප්පජ්ජන්ති තථාගතා**

බුදුරජාණන් වහන්සේලා කාලය, ද්වීපය, දේශය, කුලය සහ මව යන කාරණා පහ බලා මෙලොව උපදිති.